ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
**කොළඹ**

**පුවත්පත් නිවේදනය**

<u>තත්ත්වය උත්සන්න කිරීමේ පාකිස්ථානයේ උත්සහය ව්‍යර්ථ කරමින් ඉන්දියාවගේ ප්‍රමාණානුකූල ප්‍රතිචාර</u>

2025 මැයි 7 වන දින සින්දූර් මෙහෙයුම සම්බන්ධයෙන් පැවති මාධ්‍ය හමුවේදී, ඉන්දියාව සිය ප්‍රතිචාර ඉලක්කගත, නියමිත ප්‍රමාණානුකූල, තත්ත්වය උත්සන්න නොකරන ආකාරයේ ප්‍රතිචාර වන බව ප්‍රකාශ කළේය. පාකිස්ථාන හමුදා ගොඩනැගිලි සහ පහසුකම් ඉලක්ක නොකරන ලද බව විශේෂයෙන් සඳහන් කරන ලදී. ඉන්දියාවේ හමුදා ඉලක්ක වෙත සිදු කරන ඕනෑම ප්‍රහාරයක් සම්බන්ධයෙන් ඉන්දියාව සුදුසු ප්‍රතිචාරයක් ලබා දෙන බව ද අවධාරණය කරන ලදී.

2. 2025 මැයි 07-08 රාත්‍රියේ, පාකිස්ථානය අවන්තිපුර, ශ්‍රීනගර්, ජම්මු, පතාන්කොට්, අම්රිත්සර්, කපූර්තලා, ජලන්ධර්, ලුධියානා, අදම්පූර්, හතින්දා, චන්දිගර්, නල්, ෆලෝඩි, උත්තර්ලායි සහ භුජ් ඇතුළු උතුරු සහ බටහිර ඉන්දියාවේ හමුදා ඉලක්ක රැසක් වෙත ඩ්‍රෝන සහ මිසයිල ප්‍රහාර එල්ල කිරීමට උත්සහ කළේය. මෙම ප්‍රහාර Integrated Counter UAS Grid සහ ගුවන් ආරක්ෂණ පද්ධතීන් විසින් නිෂ්ක්‍රීය කරන ලදී. පාකිස්ථාන ප්‍රහාර ඔප්පු කරන මෙම ප්‍රහාරයන්ගේ සුන්බුන් මේ වන විට ස්ථාන රැසකින් සොයා ගැනෙමින් පවතී.

3. අද උදෑසන ඉන්දීය සන්නද්ධ හමුදා පාකිස්ථානයේ ස්ථාන රැසක ගුවන් ආරක්ෂණ රේඩාර් සහ පද්ධතීන් ඉලක්ක කරන ලදී. ඉන්දියාව එම අදාළ අංශය තුළ ම එම තීව්‍රතාවයෙන්ම ප්‍රතිචාර දක්වා ඇත. ලාහෝරයේ ගුවන් ආරක්ෂණ පද්ධතියක් නිෂ්ප්‍රභ කරන ලද බවට විශ්වාසවන්ත මාර්ගයන්ගෙන් දැනගන්නට ලැබී ඇත.

4. පාකිස්ථානය ජම්මු සහ කාශ්මීරයේ කුප්වාරා, බරමුල්ලා, උරි, පූන්ච්, මෙන්ධාර් සහ රාජෝරි ප්‍රදේශයන් තුළ මෝටාර් සහ බර කාලතුවක්කු

යොදු ගනිමින් පාලන රේඛාව හරහා සිදු කරන වෙඩි තැබීම් හි තීව්‍රතාවය ඉහළ නංවා ඇත. මෙම වැඩි තැබීම් සඳහා පාකිස්ථානය ප්‍රකෝපයට පත් නොකරන ලදී.

5. පාකිස්ථානයේ වෙඩි තැබීම් හේතුවෙන් කාන්තාවන් තිදෙනෙකු සහ දරුවන් පස් දෙනෙකු ඇතුළු අහිංසක ජීවිත දාසයක් අහිමි වී ඇත. මෙහිදී ද ඉන්දියාවට පාකිස්ථානයේ මෝටාර් සහ කාලතුවක්කු ප්‍රහාරයන් නැවැත්වීම සඳහා පියවර ගැනීමට සිදු විය.

6. ඉන්දීය සන්නද්ධ හමුදා පාකිස්ථානයේ හමුදාව විසින් ගරු කරන්නේ නම් තත්ත්වය උත්සන්න නොකිරීම සඳහා සිය කැපවීම අවධාරණය කර සිටිති.

**කොළඹ**
***2025*** මැයි ***08***

මූලාශ්‍රය:
https://pib.gov.in/PressReleseDetail.aspx?PRID=2127670&reg=3&lang=1